ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය වැඩසටහන
අවසාන පරීක්ෂණය 2007/2008

221

**MCC 1201** - ව්‍යවසායකත්වය

කාලය : පැය දෙකයි.

---

දිනය : 2008 ජනවාරි 13 වේලාව : පෙ.ව.10.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා

---

ඕනෑම ප්‍රශ්න 4 ක් සඳහා පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

01. ඔබ ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පාඨමාලාව හැදෑරූ අයෙකු බව දන්නා ඔබගේ මිතුරකු, කොළඹ අගනගරයට කි.මී.20 ක පමණ ඔබ්බෙන් පිහිටි නගරයක ව්‍යාපාරයක් ඇරඹීමට අපේක්ෂා කරයි. ඔහු පවසන අයුරු කෘමිනාශක අලෙවිසැලක්, ක්ෂණික ආහාර සැපයුම්හලක්, පොල් ආශ්‍රිත ද්‍රව්‍ය (පොල්, පැණි, විනාකිරි ආදී) විකුණුම්හලක්, නියෝජිත තැපැල්හලක්, යන මේවා අතුරෙන් එකක් ඇරඹීමට තෝරාගත් නගරයේ අවකාශ තිබේ. ඇරඹීම පිණිස මින් එක් ව්‍යාපාරයක් තෝරා ගැනීමට උදව් වන්නැයි ඔබ මිතුරා ඉල්ලා සිටී නම් එම ඉල්ලීම ඉටු කරන අයුරු පහදන්න.

02. සුභවාදී ආකල්ප සහ නොපසුබස්නා උත්සාහයද සාර්ථක ව්‍යවසායකයින් ප්‍රකට කරවන ලක්ෂණ වේ. ව්‍යවසායකයින් තුල දක්නට ලැබෙන අන් ලක්ෂණ 4 ක් සුවිශේෂී උදාහරණ සමඟ විස්තර කරන්න.

03. **i.** "සාර්ථක ව්‍යවසායකයකු සතුව දෘෂ්ටියක් පැවතිය යුතුය." මෙහිදී දෘෂ්ටිය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පහදන්න.

ඔබ දන්නා ව්‍යාපාර ආයතනයක නම සහ දෘෂ්ටි ප්‍රකාශය (දැක්ම) සඳහන් කරන්න.

**ii.** "දෘෂ්ටියක් ඇති විට තම මෙහෙවර කරා වඩාත් හොඳින් ළඟා විය හැකිය." මෙම ප්‍රකාශය අගයන්න.

04. "කවර හෝ අවදානමක් බාර ගෙන අරමුණු කරා ළඟාවීමට ප්‍රයත්න දැරීම ව්‍යවසායකයින් ප්‍රකට කරවන ලක්ෂණ වේ." ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබගේ මතය කුමක් ද? සුවිශේෂී උදාහරණ දෙන්න.

05. කෙටි සටහන් සපයන්න.

**i.** ව්‍යාපාර ආයතනයන්හි අරමුණු පිහිටුවා ගැනීම.
**ii.** සාක්ෂාත්කරණ හැකියාවන්
**iii.** ශුදුඅත (SWOT) විශ්ලේෂණය

- හිමිකම් ඇවිරිණි. -